85908

2009/71-S-I

ම සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**71 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2009 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2009 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2009

| | | |
|---|---|---|
| සිංහල I | | පැය තුනයි |
| சிங்களம் I | | மூன்று மணித்தியாலம் |
| Sinhala I | | Three hours |

※ පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(අ) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨවල තද කළු අකුරෙන් මුද්‍රිත වචන කෙරෙහි අවධානය යොමු කරමින් පාඨ හතරක අර්ථ ලිහිල් බසින් ලියන්න. තද කළු අකුරෙන් මුද්‍රිත වචන සඳහා ඔබ දෙන අර්ථ යටින් ඉරි අඳින්න.

(i) සිටුදුවණියෝත් තුන්විටක් පැදකුණු කොටලා සතර තැනෙක සිට වැඳලා 'ස්වාමීනි, මේ කෙළවර දක්ම ය. මෙවක් පටන් මුඹවහන්සේගේ මා **දක්මකුත්** මාගේ මුඹවහන්සේ දක්මකුත් නැතැ'යි කියාලා ඉදිරි දිසාවේ **සිටත් සිප** ගෙන පියා **පිටිපස්සේ** සිටත් සිප ගෙන පියා කුමක් දෝ හෝ යි සිතමින් ගල් කෙළවර පමාව සිටියහු **කුඹු** පිටිපස්වලා එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතෙකින් පිටිමුල අල්වාගෙන ඌගේ තායබල තරමට තමන්ගේ **ඥනාකෘති** වූ මායාබලය මහත් හෙයින් ගල්මුදුනෙන් දමුව හෙතෙමෙ කඩ කඩ ව ගලින් හී මිය තෙමේ ම බිලි විය. සොරපවුවේ වසන දෙවතාවාණෝ උන් දෙන්නාගේ ම කටයුත්ත දක හැඹිනැත ඊ ම පිරිමින් උපදෙස් දනිති නැත සමහර තැනක ගැනු ද උපදෙස් දනිති කිවුය.

නැතහොත්

'එ පින්වත, රජ්ජුරුවන්වහන්සේ තොප කැඳවා වදළ සේකැ'යි කිවුය. උයිත් බා ගොයින් 'මා රජ්ජුරුවන් හඳුනන්නේ නැතැ'යි කියාලා යන්ට මැළියෝ ය. ඉක්බිත්තෙන් බලයෙන් ම අත අල්වාගෙන ඇද්දෝ ය. නැත්දණියෝත් උන් හැම දක නොහඳුනන්නා සේ හැයි කොල, තොප වැන්නෝත් මාගේ බෑනණුවන් මාත් බලබලා සිටියදී අත අල්වා අදිනට **නිස්සෝ** දැයි කියලා බෑණ තෙපි රජ්ජුරුවන් වහන්සේ ළඟට එව. දියණියන් ගුණෙන් කැඳවා ගෙනයාම තිබැද්දී තොප ඇද පැද **මෙලෙස කළවුන්ගේ අත් කප්පවමි**'යි කියාලා දියණියන් කැඳවාගෙන පෙරාතු ව පලාගොසින් රජගෙට වැදලා කොටගෙන ගිය වෙස හැරලා **සව්බරණ** ලා සැරහී දවස් ගණන විඳු ලෙසට දෙවතාදූත් දෙන්නකු පරිද්දෙන් එකත්පස් ව සිටියහ. කුම්භඝොෂකයනුත් ඇදගෙන ගියහ. ගොසින් වැඳලා සිටියවුන්ට රජ්ජුරුවෝ '**පූර්ණකුම්භාකෘති** වූ කුම්භඝොෂකයෝ නම් තෙපි දැ'යි විචාරා එසේ යැයි කීකල්හි 'මෙතෙක් **වස්තු** නො නසා පිරිමසා තබාගෙන අපටත් භාග නො දී තොප ම ප්‍රයෝජන විඳිනේ හැයි' දැ'යි විචාළෝ ය.

(ii) සර්වඥයන්වහන්සේ වදාරන සේක් 'මහණෙනි, පරුෂ වචනය නම් තිරිසනුන්ටත් මනාප නොවන්නේ යැයි ෂඩ් වාර්ගික භික්ෂූන්ට ගර්හා කොට ශික්ෂාපද පනවා මෙසේ වදළ සේක. අන්‍යයා හා සමග කථා කරන්නේ **චතුර්දෝෂ විරහිත** වූ මිහිරි වූ මනාප වූ මටසිලුටු වූ මොළොක් වූ ප්‍රිය වචනයක් ම කීමිය යුත්තේ ය. **කිසි කලෙකත්** අමනුනාඥ වචනය නොකීමිය යුත්තේ ය. කුමක් හෙයින් ද යත්, නන්දිවිසාල නම් වෘෂභ තෙම අම්භාප වචනා කියන්නහුයෝ බර නො ඇද පසු ව මනාප වූ ප්‍රිය වචනය කියන්නා වූ බ්‍රාහ්මණයාගේ [illegible] ගරු භාරය ඇද්දේ යැ යි මෙසේ සර්වඥයන්වහන්සේ [illegible] ගෙන හැර දක්වා වදාරා මේ නන්දිවිශාල ජාතකය නිමවා වදළ සේක.

(iii) නුවරවැසි උපාසකයෝ ඛාද්‍යභෝජ්‍යාදි මධුර පාන ඇරගෙන විහාරයට ගොස් බුදුපාමොක් මහා සංඝයා වහන්සේට මහදන් පැවැත්වූහ. එදවස් සවස් වේලෙහි ධම්සභා මණ්ඩපයට රැස් වූ ශාරිපුත්‍ර ස්ථවිර ප්‍රමුඛ ප්‍රවර භික්ෂුසංඝයා වහන්සේ 'ඇවැත්නි අද දවස් රා බී **ත්‍රිමදගලිත** ව අවිටාල වෙව්ටම් පවුරු පදනම් වාසල් එළමින් සියලු සත්ත්වයන් භයින් පළවමින් මූර්තිමත් වූ මෘත්‍යුහු පරිද්දෙන් බුදුන් කරා එන්නා වූ නාලාගිරිහු දක සර්වඥයන් විසින් ආනන්දයෙනි, **ඉවත්වයි** තුන් යලක් වදරනු ලදුවත් ඉවත් නොවී ඉදිරියෙහි සිට බුදුන් උදෙසා ජීවිත පරිත්‍යාග කෙරෙමින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් **ඉතා දුෂ්කර** ක්‍රියාවක් කරන ලද යනාදීන් අනඳමහ තෙරුන් වහන්සේගේ ගුණ කථනය කෙරෙමින් වැඩහුන් සේක.

(iv) තරසර සුනෙර තද තෙද දිමුතු **දිවයුර**
පුවතර ගැඹර සමුදුර කැලුම **තිලඹර**
සොම්බර පවර නිසයුරු නුවණ **සුරගුර**
සුරවර සැරද විබිසණ දෙව් කැලණි **පුර**

[ දෙවැනි පිටුව බලන්න.

(v) **සිරිසඳ** වන් සවි සිරි දියුණුව රදන
සිතුමිණ වන් යැදි යැදි හට දනින් දෙන
සරසවි වන් නුවණින් පහළ ව පෙනෙන
නවසඳ වන් ලෙව් වැසි අදරින් වඳන

(ලකුණු 16 යි)

(ආ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "යම් ගාථාවක් අසා සත්ත්වයෝ නිවන් දකිත් නම් ඒ ම යහපත"

(ii) "පරුෂ වචනය නම් කිසිවක් හටත් මනාප නොවන්නේ ය"

(iii) "කිසිම රස්සාවක් කරන්න බැරි කවින් බතලකොළ හිටවන මිනිසුන් මන්ත්‍රීන් වීමේ විපාක තමා."

(iv) "දත් ඉතින් ඉගෙන ගත්තම විතරක් මදි රස්සාවක් කරන්න."

(v) "නැත කිසි බාද විඳුමට සැපෙනා"

(ලකුණු 12 යි)

(ඉ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් සපයන්න.

සමන් පොහොට්ටුවක් බිමයි පිපෙන්නටත් කලින්
හදක් වැසී තිබේ වලාකුළින් නබෝ ගැබේ
මොකෝ සොබා දමේ පවා මෙසේ වෙසේසියක්?
හහා! හහා! කුඩා බබෙක් නිදයි මිනී වළේ

මිනිස් ලොවේ උපන්නොතින් හොඳයි කියා සගෙන්
අවුත් මෙසේ මගේ ගෙයේ මැණික් කොතක් ලෙසින්
වුසූ පුතේ ලොවේ ඉතින් දෙසුත් බලා ඇසින්
ගියා යළිත් ගියා ද? නැ ගියේ මගේ හිතින්

වනේ කුසුම් පිපී තැසේ මිලාන වී වැටේ
සුගන්දයක් වනේ මිසක් පිටස්තරින් නො වේ
අහිංසකත්වයෙන් පිරී මගේ කුඩා පුතා
අගේ මට යි අගේ මට යි එමෙන් ම මැණිට යි

ගහක් ගලා ගියාලු වාලුකා තලේ වැදී
කුඩා ගෙඩිත් වැටේ අකල් නැසීමකින් ලොවේ
සොබා දමේ ගිමන් තලේ ළපල්ලයක් වෙලා
පුතා ද එක් වුණා අහෝ නො එන්නවුන් සහා

ගොයම් නැඳු වෙල යි අමාවකේ අහස් කුස යි
ගහක් නොවූ රට යි මලක් නොදක්කවූ ගස යි
වසන්ත රාජයා නොගත් සොබාදෙව සුන්දරි යි
වගෙයි සමන් පුතා ගියෙත් මෙද මගේ ගෙයත්

ළමුන්ගෙ ලෝකයේ විනෝදයේ දුකින් නැඳූ
අඹ යි, දඹ යි, දනු යි, මොර යි පැසී ඉදී තිබේ
සමන්ගෙ දේ එපා ය කාට වත් ම දෙන්න යැයි
කියා විකක් වැටී නරක් වෙමින් තිබේ බිමින්

විනාශ පද්මයෝ නැසෙත් සැද වලා බලා
එහෙත් උදේ පිපෙත් විලේ සහස්රැසින් තෙමී
නෙළුම් මලක් වගේ වෙමින් සමන් පුතේ යළිත්
මටයි මගේ පියම්බිකාවටයි පුතා වෙයත්

(ලකුණු 12 යි)

2. "සද්ධර්මරත්නාවලී කතුවරයා අනුගමනය කොට ඇත්තේ දේශීය ගැමි ජනයාට වඩාත් සමීප බණ කතා රීතියයි." මෙම කියමන **සද්ධර්මරත්නාවලියෙහි** නියමිත කථාවස්තු දෙකක් වත් ඇසුරු කොට නිදසුන් සහිත ව විභාග කරන්න.

(ලකුණු 15 යි)

**නැතහොත්**

"චරිතය විනිවිද දුටුවන්ගේ කතා" නමින් ජාතක කථා හැඳින්වීම කොතරම් සහේතුකදැ'යි නියමිත ජාතක කථා දෙකක් වත් ඇසුරු කොට නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

"සැළලිහිණි සන්දේශයයෙහි දක්නට ලැබෙන විශේෂත්වය වනුයේ සංක්ෂිප්ත වර්ණනා සහ සුගම භාෂා ව්‍යවහාරයයි" අදාළ නිදසුන් දක්වමින් මේ අදහස පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

"කොළඹ නගරයේ සිංහලයන්ගේ අනුකාරක ජීවිතය කවර ගැටියෙන් වර්ණනා කරනු ලැබුව ද එහි නොගැඹුරු බව හා බාහිර විසිතුරුව ධ්වනිත වනු වැළැක්විය නොහැක්ක." මාර්ටින් වික්‍රමසිංහයන් යුගාන්තය නවකතාව පිළිබඳ ව කරන මෙම ප්‍රකාශය කොපමණ දුරකට සාධාරණද යි එම නවකතාවෙහි චරිත තුනක් වත් පදනම් කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

"ආපසු ගමන කෙටිකතාවෙන් නිරූපණය වන්නේ සම්ප්‍රදය සහ නූතනත්වය අතර ඇති ගැටුම ය." එහි චරිත කෙරෙහි අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විමසන්න. (ලකුණු 15 යි)

"නූතන සමාජ පසුබිම හා බද්ධ සංකීර්ණ ප්‍රශ්න වර්තමාන කවියා අනාවරණය කරන්නේ පුද්ගලබද්ධ අත්දැකීම් පදනම් කොට ගෙන ය." නූතන පද්‍ය සංග්‍රහයේ දැක්වෙන පද්‍ය පන්ති තුනක් වත් නිදසුන් කොට දක්වමින් මෙම අදහස පිරික්සන්න. (ලකුණු 15 යි)

මනමේ නාට්‍යයේ සාර්ථකත්වයට කවර කරුණු හේතු වීද යි නාට්‍ය පෙළ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

* * *

www.pastpaperlk.com
www.artsapi.lk

85908

AL/2009/71-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

71 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2009 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2009 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2009

| | | |
|---|---|---|
| සිංහල | II | පැය තුනයි |
| சிங்களம் | II | மூன்று மணித்தியாலம் |
| Sinhala | II | Three hours |

※ 1, 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දක්වෙන ව්‍යුහගත ඡේද අතුරෙන් **එකක්** තෝරාගෙන **රචනාවක්** ලියන්න.

(i) බොහෝ උපකාරක පන්තිවලින් ලැබෙන දැනුම විභාගය ම පමණක් අරමුණු කොට පවත්නා බවටත් එයින් බොහෝ සිසුන්ගේ සිතීමේ ශක්තිය පිරිහෙන බවටත් මත පැතිර තිබේ. මේ මතවල ඇති සත්‍යාසත්‍යතාව කවරේද'යි ඔබේ අත්දැකීම් ද උපයෝගී කරගනිමින් රචනාවක් ලියන්න.

(ii) දකුරේ මානුෂික මෙහෙයුම්වල දී ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක හමුදා මගින් අත්පත් කරගත්, කොටි ත්‍රස්තවාදීන් එක්රැස් කළ අනේකවිධ යුද්ධායුධ, ඔවුන් මුවාංපෑ ඊලාම් රාජ්‍යය ගොඩ නැගීමේ අරමුණ ඉක්මවා වෙනත් ඉලක්ක කෙරේ යොමු වී පැවැති බවට ඇතැම්හු අනුමාන කරත්. මේ සම්බන්ධ ව ඔබගේ නිරීක්ෂණ ද ඇතුළත් කරමින් රචනාවක් ලියන්න.

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය නො වන ඇතැම් සංවිධානවල ක්‍රියාකාරිත්වය රටේ ස්වාධීනත්වයට, සාමයට, සංස්කෘතියට පමණක් නො ව සංවර්ධනයට ද අහිතකර බවට විවිධ මත පැතිර ඇත. මේ සම්බන්ධයෙන් ඔබගේ ස්ථාවරය කරුණු සහිත ව විග්‍රහ කරමින් රචනාවක් ලියන්න.

(iv) මීට දශක කිහිපයකට පූර්වයෙහි වර්ණ භේදය බලවත් ව පැවැති ඇමෙරිකා එක්සත් ජනපදයෙහි, බරැක් ඔබාමාගේ ජනාධිපතිධූර සම්ප්‍රාප්තිය අසිරිමත් සාමාජික, දේශපාලනික සංසිද්ධියකි. මෙයින් හෙළි වන අනාගත් ලෝකයේ දේශපාලන ස්වරූපය ගැන අවධානය යොමු කරමින් රචනාවක් ලියන්න.

(v) කලාව වූ කලී ආනන්දයෙන් පටන් ගෙන ප්‍රඥාවෙන් අවසන් වන්නකැයි කියනු ලැබේ; එය ආනන්දයෙන් පටන් ගෙන ආනන්දයෙන් ම කෙළවර වන්නේ නම් එයින් මානව සමාජයට සිදු වන්නේ කෙබඳු ප්‍රතිඵලද'යි විමසමින් රචනාවක් ලියන්න.

(ලකුණු 25 යි)

2. (අ) පහත දක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ක්‍රි. පූ. 6/5 සියවස් හරියේ දී, උතුරු ඉන්දියාවේ වයඹදිගින් හෝ/හා පෙරදිගින් මුහුදු මගින් පැමිණි ඉන්දු-ආර්ය ජනපදික පිරිස් විසින් ලක්දිව ජනාවාස පිහිටුවා ගත් තැන් පටන්, මිහිඳු මාහිමියන් ප්‍රධාන බෞද්ධ ධර්ම දූතයන් විසින් දෙවනපෑතිස් රජු ඇතුළු ලක්වැසියන් බුදුසමය ගන්වා, බුදුසසුන අඛණ්ඩ ව පවත්වාගෙන යැමෙහි ප්‍රබල සිංහල භික්ෂු පරම්පරාවක් ඇති කරනු ලබන තෙක් කාලය තුළ ඉන්දියාවෙහි මෙන්ම මේ රටෙහි ද අධ්‍යාපන කාර්යභාරය පැවැත්තේ බමුණු ගුරුවරුන් අතෙහි බව වංශකථාදියෙන් පෙනේ. එබැවින් ඒ කාලයෙහි ලක්දිව අධ්‍යාපනයද ඉන්දියාවෙහි මෙන්ම උසස් කුලවත් ප්‍රභූ පවුල්වල දරුවන්ට පමණක් සීමා වූවාට සැක නැත. එහෙත් බුදුසසුන සංස්ථාපිත ව උගත් භික්ෂූන් රට පුරා විසිර යැමත් සමඟම, උස් පහත් භේදයකින් තොර ව සමාජයෙහි හැමදෙනාගේම ආධ්‍යාත්මික ගුරුවරුන් වශයෙන් සේවයෙහි යෙදුණු එකී භික්ෂූන් වෙතට, ධර්මය ඉගැන්වීමට අමතරව සාක්ෂරතාවෙහි පටන් ගණිත මිනිතාදී කාලීන විෂය ඉගැන්වීමේ වගකීමද පැවරිණ. මුලදී උගත් භික්ෂූන් වෙතින් ප්‍රදේශීය වශයෙන් ඉටු වූ මේ කාර්යය, කල් යැමේදී එබඳු උගත් භික්ෂූන් බොහෝ දෙනෙකු විසූ අනුරාධපුර තිස්සාරාම මහාවිහාර, අභයගිරි මහාවිහාර වැනි මහාවිහාරයක කේන්ද්‍ර ගත වීමෙන්, ඒ කරා දේශීය විදේශීය ශිෂ්‍යයන් ඇදී ඒමෙන්, වර්තමාන විශ්වවිද්‍යාලය ස්වරූපයේ උසස් අධ්‍යාපන ආයතන බිහි වීමටද මං පැදිණ. එයට අමතරව, අවශ්‍ය අයට ප්‍රවීණ ගිහි ඇදුරන්ගේ අතවැසිව උගෙන වෛද්‍ය, නක්ෂත්‍ර, වාස්තුවිද්‍යාදියෙහි හා විවිධ සටන්ක්‍රම ආදියෙහිත් වෘත්තීය පුහුණුවක්ද ලබා ගත හැකිව තිබිණ. විහාරීය අධ්‍යාපනය පැවිදි හා පිරිමි ගිහි සිසුන්ට සීමා වූ අතර, කාන්තා පක්ෂය අධ්‍යාපනය ලබා ගත්තේ උගත් ගිහි ඇදුරන් වෙතිනි. අනුරාධපුර යුගයේදී මෙහෙණවරවල විසූ උගත් භික්ෂුණීන් වෙතින්ද කාන්තාවන්ට ධර්මශාස්ත්‍රීය

[ දෙවෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapl.lk

www.pastpaperlk.com



අධ්‍යාපනයක් ලබා ගත හැකි විය. මේ යුගයේ මුල් අවදියේදී, ලක්වැසි පවුල්වල මව්පියන් සිරිතක් වශයෙන් සිය දරුවන් පස් හැවිරිදි වියේදී ශික්ෂා ග්‍රහණය කර වූ බව **සද්ධර්මාලංකාරය** මෙන්ම **රසවාහිනියද** පවසයි. ස්ත්‍රී/පුරුෂ භේදයකින් තොරව රටවැසියන් අතරෙහි සාක්ෂරතාව ව්‍යාප්ත වීමට මෙය එක් හේතුවක් වන්නට ඇත. වංශකථාවල සඳහන් අක්බෝ I රජු කල විසූ දෙළොස් මහා කවියන්ගේ නාමාවලියෙන් හා සීගිරි ගී රචකයන්ගේ සටහන්වලින් අනුමේය වන පරිදි මේ තත්ත්වය ඒ වන තුරුද රැකී පැවතිණ."

(i) වත්මන් විශ්වවිද්‍යාලයක ස්වරූපයේ උසස් අධ්‍යාපන ආයතන එවක අනුරාධපුර බිහි වීමට මං පෑදූ හේතුව කුමක් ද?

(ii) අක්බෝ I රජු කල විසූ දෙළොස් මහා කවීන්ගේ නාමාවලියෙන් හා සීගිරි ගී රචකයන්ගේ සටහන්වලින්, මේ ලේඛකයා අනුමාන කරන කාරණය කුමක් ද?

(iii) ක්‍රි. පූ 6/5 සියවස්වල පටන් දෙවනපෑතිස් රජු කල මිහිඳු හිමියන් පැමිණ සිංහල භික්ෂු පරපුරක් ඇති කරනු ලබන කාලය තෙක් ලක්දිව අධ්‍යාපනය උසස් කුලවත් ප්‍රභූ පවුල්වල දරුවනට සීමා වූ බවට මේ කතුවරයා පවසන්නේ කවර කරුණක් නිසා ද?

(iv) "ශික්ෂා ග්‍රහණය කරවූ බව" යන පාඨයෙහි සරල තේරුම කුමක් ද?

(v) උසස් කුලවත් ප්‍රභූ පවුල්වල දරුවනට අයත්ව පැවැති අධ්‍යාපනය සාමාන්‍ය දරුවන් කරා ද ව්‍යාප්ත වීමට හේතු වූ කරුණු කුමක් ද?

(ලකුණු 10 යි)

(ආ) "A 9 මාර්ගය යළි විවෘත වීමෙන් පොදුවේ ලක්වැසියන් ලබන දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික අභිවර්ධනය" යන මාතෘකාව යටතේ, ඔබගේ පාසලේ ගුරු දෙගුරුන් සිසුන් අමතා ඔබ පැවැත් වූ දේශනයේ අන්තර්ගතය ලිඛිත ව්‍යාකරණානුකූල සිංහල භාෂාවෙන් (කටවහරින් නො වේ.) ඉදිරිපත් කරන්න. (මේ සඳහා **වචන 250 - 300** අතර තිබීම ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

3. (අ) පහත දැක්වෙන එක් එක් වාක්‍යයක, එක් පදයක අක්ෂර වින්‍යාසය **සදොස්** ය. ඒ පදය පමණක් නිවැරදි කොට ලියන්න.

(i) ඒ මහ ගිජිඳුගේ යුවල දළ අතිශයින් තියුණු ය.

(ii) මනුෂ්‍ය ශරීරය අනේකවිධ වූ ශෛලයන්ගෙන් ගහණ ය.

(iii) හෙළ බස්හි වාග්කෝෂය පළල් ය.

(iv) වීරෝද්‍ර රණ විරුවාණනි, සතුරු පහරින් ඔබ මුළු සිරුරේ වන හට ගැනී ඇත.

(ආ) පහත දැක්වෙන පද්‍යයෙහි පද බෙද ඇති ස්වරූපය පදනම් කොට ගනිමින්, එහි පද **අකාරාදි** පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

"බැඳි සිවුයර | බසින්
මුනිඳු සිරිතක් | වෙසෙසින්
ඇසියටී | අදහසින්
කෙලෙන් ආරාදනා | සතොසින්"

(ඉ) පහත දැක්වෙන පද **සන්ධි** කරන්න.

(i) පූර්ව + අපර
(ii) බුදු + සරණ
(iii) නිති + අනුකූල
(iv) මුඳු + කියලි

(ඊ) පහත දැක්වෙන පද **විසන්ධි** කරන්න.

(i) දිනිසුරු
(ii) පිළිතුරු
(iii) උපනුපන්

(උ) "මධුර" යන්නෙන් "මාධුර්‍ය" යන පදය සෑදෙන්නාක් මෙන් "සුබ" යන්නෙන් සෑදෙන පදය කුමක් ද?

(ඌ) "ආශ්වාදය" / "ආස්වාදය" යන පද දෙකින් නිවැරදි පදය කුමක් ද?

(එ) "ඉහළ" යන පදයෙහි ඇතුළත් තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?

(ඒ) "දුබල" යනු කවර වර්ගයේ සමාස පදයක් ද?

(ඔ) පහත දැක්වෙන ගීත ඛණ්ඩයෙහි තද කළු යෙදුම් දෙකෙහි **අර්ථ** පැහැදිලි කරන්න.

(i) "**ගන ගුම් මියුරිඳු නද දෙන - විලඹින්** සවතොත ඔබ සර
නිතියෙන් අප වාසය වන අඳුරින් පිරි මේ ගිරි ලෙන (ii) **පුරඳර නන්දන උයනක් සේ** සුන්දර වී එකාවර".

(ඕ) පහත දැක්වෙන වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.**

(i) අනාගත බොහෝ ශ්‍රී ලාංකිකයන් රෝගීහු වෙත් ද?
(ii) ඒ ගුරු මහතා ධනවතෙක් ද ගුණවතෙක් ද වෙති.

(ලකුණු 20 යි)

[ තුන්වෙනි පිටුව බලන්න.

1\. (අ) පහත දක්වෙන පදවලට මුල් වූණු ප්‍රකෘති රූප වෙන් කොට දක්වන්න.

(i) ගබඩාවට (ii) සිටාණ (iii) මළවෙහි

(iv) කොල්ලෝ (v) ඇත්තු (vi) කොස්තු

(ආ) පහත දක්වෙන පදවල උක්ත විභක්ති පදත් අනුක්ත විභක්ති පදත් වෙන් කොට ලියන්න.

(i) ගොවියන් (ii) වේයෝ (iii) ඇතැමුන්

(iv) හිවල්ලු (v) ළදක (vi) ඇදුරෝ

(ඇ) පහත දක්වෙන පදවලට අනුරූප පූර්ව ක්‍රියා පද ලියන්න.

(i) සදයි (ii) වැටෙයි (iii) නමදී

(iv) දෙයි (v) පියයි (vi) වඩයි

(ඈ) පහත දක්වෙන පදවල ඇතුළත් වන උපසර්ග වෙන් කොට දක්වන්න.

(i) උපස්ථාන (ii) පිළිගනී (iii) ප්‍රත්‍යක්ෂ

(iv) දුදන (v) අවතාර (vi) පරිත්‍රාණ

(ඉ) පහත දක්වෙන නාම පදවල ඇතුළත් වන තද්ධිත ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

(i) මැදිරිය (ii) මිණිමුවා (iii) සිහිලළ

(iv) බයාදු (v) සිහිති (vi) අරටු

(ලකුණු 15 යි)

(අ) පහත දක්වෙන වාක්‍යවල සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට ලියන්න.

(i) සොනෙහස් පුල්වල හැඟී වැතසෙයි.

(ii) ඕ පොමෙමෝ සිතුවමක් අඳිති.

(iii) අම්මණ්ඩි අප දකී ද්‍ය?

(iv) බුදුහු දෙදුසුයේ සිවුහයේ ය.

(v) ගෘහ නිර්මාණ ශිල්පීන් කොළඹ සිට කත්කසත්තුරේ බලා පිටත් වෙති.

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) [illegible] පොහොර පිටා-[illegible] වෙළෙඳ පොළට (ගියා ය. / ගියේ ය.)

(ii) සිංහයෙක් ද වෘෂභයෙක් ද මිත්‍ර ව (විසූහ. / විසී ය.)

(iii) පින්නවල අලි අනාථාගාරයෙහි (ඇතුන් / ඇත්තු) ඇත.

(iv) (මම / මා) බැංකුවට යද්දී මහා වැස්සක් කඩා වැටිණ.

(v) (දෙමව්පියෝ / දෙමව්පියන්) කියන ද අසත්‍ය නො වේ.

(ඇ) පහත දක්වෙන වාක්‍ය, කර්ම කාරකයට හරවන්න.

(i) ජනපති ත්‍රස්තයන් මඩී.

(ii) ගවසු උවැසියෝ පහන් දල්වූහ.

(iii) පරිසරවේදීහු පරිසර හිතකාමීන් ලවා මහ මඟ දෙ පස පැළ රෝපණය කරවත්.

(iv) ඔව මා පාප මිත්‍රයන්ගෙන් රැක්කා ය.

(v) ඇද්ද මුවා ද වල් ඌරා ද මැරුවේ ය.

(ලකුණු 15 යි)

පහත දක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) "මුනි පද උතුමගේ - හෙ වළා දහම් දිවගේ"

(ii) උඩු පියැඹි කොළය වැටෙනවත් එක යි අව්වටත් එක යි.

(iii) "පිරුමෙන් ඇරගත් අවර්ණ මිශුලට"

(iv) කන්ඩා ඉංගිරිසින් ගියාට එනේ.

(v) "බඹු ඇසි වැරු ඇසුපුලැහුලවිල තඹුරු"

(vi) කැස්බෑවාගේත් කිකිළියගේත් බිජු දැමීම වගෙ යි.

(vii) "වැව් අළු ණු පිරි දිය - පිටවාන හැර සුරැකි කළ මෙන්"

(viii) කිරෙන් බැද්දත් තෙලෙන් බැද්දත් තිත්ත තිබ්බටු තිත්තම යි.

(ix) "පාලා [illegible] වැනි බහුරු කෝලම්"

(x) කුකුළාට ඉස්සර වෙලා පෙඳේ දිව්වා වගෙ යි.

(xi) "නො මඳ ගං හෝ ඇළ දිය නිති වැදත් නො පිරි සිඳු මෙන්"

(xii) බුලත් අඬව ගම්මිරිස් කොළ තිබ්බා වාගෙ යි.

(xiii) "අග සිට මුලට උක් - කන වැන්න සුදනන්ගෙ ගුණකම්"

(xiv) සතක්කට් නොකිවූ කට උගේ කට හුඹස් කට.

(xv) "කලා සපිරි සිසිවන එන කැලාටන්"

(ලකුණු 15 යි)

[illegible] පිටුව බලන්න

7. (i) "දසබල", "පසැස්", "විදුරත්" කවර වර්ගයට අයත් පද ද? මේ වර්ගයේ තවත් පද දෙකක් ලියන්න.

(ii) "වන්දනීය", "මානනීය", "වර්ණනීය" කවර වර්ගයට අයත් පද ද? මෙ වර්ගයට අයත් තවත් පද දෙකක් ලියන්න.

(iii) "දුක සැප", "අහට පයට", "ඇත මැත" යන යුගල පද සෑදී ඇත්තේ කෙසේ ද? මේ වර්ගයේ තවත් යුගල පද දෙකක් දක්වන්න.

(iv) "ශූරතා", "චපලතා", "කුශලතා" කවර වර්ගයට අයත් පද ද? මෙ වර්ගයට අයත් තවත් පද දෙකක් ලියන්න.

(v) "කොහු ඉදල් පාපිසි", "ගං හෝ ඇළ දොළ", "අඳ ගොළු බිහිරන්" කවර සමාසයකට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද දෙකක් ලියන්න.

(ලකුණු 15 යි)

8. පහත (i) සිට (iv) තෙක් කොටස්වල දක්වෙන මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

නැතහොත්

(i) සිට (iv) තෙක් කොටස්වලින් දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියා, (v) කොටසට ද පිළිතුරු සපයන්න.

(i) මිශ්‍ර සිංහලයේ ඝෝෂාක්ෂර

(ii) ලිඛිත සිංහලයේ විධි ක්‍රියා

(iii) පුරුෂවාචී සර්වනාම

(iv) භාව කෘදන්ත

(v) පහත දක්වෙන පාඨවලින් හතරකට පුදුසු ප්‍රස්තාව පිරුළු හතරක් දක්වා එයින් එක් ප්‍රස්තාව පිරුළක් යොද ගනිමින් එහි අර්ථය ප්‍රකට වන සේ වාක්‍යයක් ලියන්න.

(අ) හිතවත් බවක් පෙන්වා මුළා කොට විපතක් සිදු කිරීම

(ආ) නියම ක්‍රමය දන්නා අය අමාරුවට පත් නො වන බව

(ඉ) හිමියා අහිමියා කොට අනුන්ගේ දේ අත්කර ගැනීම

(ඊ) එක කරදරයක් මදිවාට තවත් කරදරයක්

(උ) අවුලක් ලිහනු වෙනුවට තව තවත් අවුල් ඇති කිරීම

(ලකුණු 15 යි)

* * *